# සමාජවාදී ආර්ථිකයේ මධ්‍ය ලීවරය හා සමබරතාව



සමාජවාදී ආර්ථික යන්ත්‍රය යනු අයාලේ දිව යන්නක් නොවේ. එය නිශ්චිත සැලැස්මක, මධ්‍යගත මෙහෙයුමක් යටතේ දිව යන්නෙකි. එපමණක් නොවේ, එය තම සමබරතාව ඉතා සැලකිල්ලෙන් රැක ගන්නා ආර්ථික ක්‍රියාවලියකි. එනිසා ආර්ථිකයේ මෙහෙයුම අතින් එය ධනවාදයට හාත්පසින් වෙනස් ක්‍රියාන්විතයකි. එනිසා සමාජවාදී ආර්ථිකයේ අංග හඳුනා ගැනීමේ අවශ්‍යතාවට පෙරාතුව සැලසුම් සහගත, මධ්‍යතගත හා සමබර ආර්ථිකයක් යනුවෙන් සමාජවාදය අදහස් කරන්නේ කුමක් දැයි සරලව විමසා බැලිය යුතු ය.

ධනවාදී ආර්ථිකය මෙහෙය වෙන්නේ තරගය මතය. වෙළඳපොළ නම් ආර්ථික තරග බිම මත එම ආර්ථිකය තම අරමුණ සපුරා ගනියි. ධනවාදී ආර්ථිකයේ ඒකායන අරමුණ ලාභයයි. ලාභය පසු පස ආර්ථිකයේ අහඹු ඔස්සේ ලූහුබැඳීම එහි ක්‍රියාන්විතයයි. වෙළඳපොළ තරගය සකසන බිමේ අයාලේ යමින් ලාභ ලූහුබඳින ධනවාදී ආර්ථිකය සැලසුම් කරන්නේ ප්‍රාග්ධන මෙහෙයුම් පමණි. ඒ තුළ පළමුව නිදහස් තරගය ද පසුව අධිරාජ්‍යවාදී අවධියේ දී ඒකාධිකාරී තරගය දක්නට හැකි විය. එනිසා සමස්තයක් ලෙස ධනවාදී ආර්ථිකය අරාජික ය. එය එහි ජාති ලක්ෂණයකි.

ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගත භාවය යළිත් එයට ප්‍රතිපක්ෂව සමාජවාදය මධ්‍යගත සැලසුමක මෙහෙයැවේ. මෙහි මධ්‍යගත යන්නෙන් අදහස් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදයම ය. සංවිධාන ප්‍රතිපත්තිමය. සමාජවාදයට මධ්‍යගත සැලසුමක් ඇත. එය අත්තනෝමතික ව ආර්ථිකය මත පටවනු ලබන්නක් නොවේ. සමස්ත ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍රයන්ට ඇහුන්කම් දෙමින් සකස් කරනු ලබන පුළුල් සැලැස්මක මධ්‍යගත මෙහෙයුමකි. එම සියලූ ක්ෂේත්‍ර තම දායකත්වයෙන් සකස් කරන ලද පොදු සැලැස්මට අනුව කටයුතු කිරීමට වගකීමෙන් බැඳී සිටියි. උදාහරණයක් ලෙස පරිභෝජන භාණ්ඩ ක්ෂේත්‍රය විසින් ආර්ථික සැලැස්මට තම සම්පත් ද අවශ්‍යතාවන් ද එහි පවතින මට්ටම ද සලකමින් සැලසුම් ඉදිරිපත් කරයි. ඒ අනුව එයට අදාළ ඇස්තමේන්තු සකස් කරයි. පරිභෝජන භාණ්ඩ ක්ෂේත්‍රමයේ අනු ශාඛාවන් ද මෙයට දායක වේ. ඒ අනුව එයට අදාළ ඉදිරි ආර්ථික සැලසුම් සකස් කිරීමේ දී ආර්ථිකයේ සියලුම අංශ සැලකිල්ලට ලක් වන අතර එහි මහා සැලැස්මට ඒ සියල්ල දායක වේ. මෙම සැලැස්ම මෙහෙය වෙන්නේ උත්තරීතර ආර්ථික මණ්ඩලයකින් ය. එහි අරමුණ වන්නේ ආර්ථික ක්‍රියාවලිය අරාජිකත්වයෙන් හා අන්ධභාවයෙන් ඉවතට ගැනීමයි. නිශ්චිත මෙහෙයුමක් ඔස්සේ ආර්ථිකයේ විවිධ පරිපථයන් පටලවා නො ගනිමින් අනවශ්‍ය කාන්දුවීම් හා ලහු ගත වීම් වළක්වාලීම යි. ආර්ථිකය නිශ්චිත ඉලක්කය වෙතට නිශ්චිත කාලපරිච්ඡේදයක රැගෙන යාමයි.

## සැලසුම් සහගත ආර්ථිකය

සැලසුම් සහගත ආර්ථිකයක මූලික සැලැස්ම ප්‍රධාන අංශ දෙකක් ඔස්සේ විහිද යයි. ඒ නිෂ්පාදන මාධ්‍ය නිෂ්පාදනය හා පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය යනුවෙන් ය. නිෂ්පාදන මාධ්‍ය නිෂ්පාදනය යනු ආර්ථිකයේ වේගවත් වර්ධනය උදෙසා වන අත්‍යවශ්‍ය සාධකයකි. රටක ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා විද්‍යුත්කරණය වැනි යටිතල පහසුකම් වර්ධනය අත්‍යවශ්‍යය. අමු ද්‍රව්‍ය වර්ධනය කර ගත යුතු ය. තවද නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය යන්ත්‍ර නිපදවිය යුතු ය. මේ සඳහා විදුලි බලාගාර, මහා යන්ත්‍ර නිෂ්පාදනාගාර අවශ්‍ය ය. ඒ ඔස්සේ නව නිපයුම් කර්මාන්ත (නිමි භාණ්ඩ කර්මාන්ත) පුළුල් කළ යුතු ය. මෙහි දී තාක්ෂණික දැනුම වර්ධනය උදෙසා විවිධ පර්යේෂණ මෙන් ම තාක්ෂණය ආනයනය ද අවශ්‍ය ය. දේශීය ශිල්පීන් විදේශ පුහුණු වීම් හා අධ්‍යයනයන්ට යැවීමත්, විදේශීය පුහුණු තාක්ෂණය කොන්දේසි සහිත ව ගන්වා ගැනීමත් අවශ්‍ය ය. සැබවින්ම මේ සියල්ල බැර කර්මාන්ත ක්ෂේත්‍රයට අයත් ය. ආර්ථික සැලැස්ම තුළ රටේ ද්‍රව්‍යමය සම්පත් හා ශ්‍රම සම්පත් පිළිබඳව ඇගයීමක් අවශ්‍යය. එසේම නිශ්චිත කාලයකට අදාළ ව නිෂ්පාදන අවශ්‍යතා සැලකිල්ලට ලක් කළ යුතු ය.

දෙවනුව මෙම සැලසුම් සහගත ආර්ථික සැලැස්ම පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය නම් ආර්ථික ශාඛාව ද සැලසුම් කරයි. එය සමාජවාදී ශ්‍රම සම්පතෙහි වර්ධනය උදෙසා ය. සමාජවාදී ජන ජීවිතය යහපත් කිරීම උදෙසා ය. ආරම්භයේ දී මෙය සුළු නිෂ්පාදනයේ සිට මහා කර්මාන්ත ශාලාවන් හි නිෂ්පාදනය දක්වා පුළුල් හා සංකීර්ණ ක්ෂෙත්‍රයක දිව යයි. එහි අවසාන ඉලක්කය මහා යන්ත්‍ර හරහා එම ඉලක්කයන් සපුරාලීමයි. ආහාර නිෂ්පාදනය ද අයත් වන්නේ මෙයට ය. කෘෂිකර්මාන්තයේ දිසාව විය යුත්තේ ද යාන්ත්‍රීයකකරණය හෙවත් මහා යන්ත්‍ර සූත්‍ර භාවිතයයි. ගමනාගමනය, සෞඛ්‍යය, වැනි ක්ෂෙත්‍ර ද අයත් වන්නේ සැලැස්මේ මෙම කොටසට ය.

ආර්ථිකය වර්ධනය හා ශක්තිමත් වීම ඉදිරියට ගෙන යනු ලබන අනෙක් ප්‍රධාන සාධකයක් වන්නේ ජනතාවගේ දැනුවත් භාවයයි. ඒ සඳහා ධනවාදී මතවාදයෙන් ජනතාව තුළ තහවුරු කොට ඇති පුරුදු පුහුණු වීම් වෙනස් කළ යුතු ය. මෙය කල් ගන්නා සහ අසීරුතම කාර්යයකි. එහෙත් එය ජය ගත හැකිය. මේ සඳහා සංස්කෘතිකමය පරිවර්තනයක් ද අවශ්‍ය ය. ජනතාවගේ සාක්ෂරතාව ඉහළ නැංවිය යුතු ය. එය පරිගණක සාක්ෂරතාව දක්වා එසවිය යුතු ය. කෘතිම හෝ බලහත්කාරී සංස්කෘතික පෙරළි ඇති කරනු වෙනුවට සමාජවාදී ආර්ථික දේහය වර්ධනයට අනුරූපී ව සංස්කෘතිය ශක්තිමත් කළ යුතු ය. එහි හදිසි කාර්යයක් ලෙස පැරණි ධනවාදී මත පැරැදවීමේ මෙහෙයුමක් අවශ්‍යය. මහා ආර්ථික සැලැස්ම තුළ එම කාර්යය ද අඩංගු විය යුතු ය.

ධනවාදී ආර්ථික ලීවර සමාජවාදී අර්ථයෙන් වැටුප්, අතිරික්ත වටිනාකම, ඉතිරි කිරීම්, මුදල්, වෙළඳපොළ වැනි ධනේශ්වර ආර්ථිකය හසුරුවන ලීවර සමාජවාදය තුළ ද භාවිතාවේ. එනිසා සමාජවාදයට එරෙහි මත හසුරුවන්නන් මෙය හුවා දක්වමින් පවසන්නේ සමාජවාදී ආර්ථිකය හා ධනවාදී ආර්ථිකය අතර වෙනසක් නොමැති බව ය. නමුත් ඉහත වචනයන්හි ප්‍රකාශිත අර්ථයෙන් ඒවා ධනවාදී වචන හා සමාන නමුදු භාවිත අර්ථයෙන් සමාජවාදය තුළ මෙම ලීවරයන්ගේ කාර්ය භාරය ඉතා වෙනස් ය. ඒවා එකිනෙක කෙටියෙන් වටහා ගැනීම පහසුවක් වනු ඇත.

## වැටුප්

වැටුප් යන්න සමාජවාදයේ සාධාරණ බෙදාහැරීමේ මාධ්‍යයක් වශයෙන් ධනවාදයට වෙනස් ව හැසිරෙන්නේ කෙසේ දැයි අප මෙයට පෙර ලිපි වලින් විස්තර කොට ඇත්තෙමු. ඒ අනුව ධනවාදයේ සූරාකෑම වසන් කරන මාධ්‍යයක් ලෙස පැවති වැටුප් සමාජවාදයේ දී එය සාධාරණ ලෙස බෙදා හැරීමේ මාධ්‍යයක් ලෙසින් හැසිරවේ.

## අතිරික්ත වටිනාකම

සමාජවාදී ආර්ථිකයේ අතිරික්ත වටිනාකම් බිහි කරයි. එහෙත් එය සමාජවාදී අතිරික්තය. ධනවාදයේ මෙන් එය පෞද්ගලිකව ධනපතියකු විසින් හිමි කර ගන්නේ නැත. සූරාකෑමක් නැත. එය සමාජවාදී සාමූහික ධනයකි. එය නැවත බෙදී යන්නේ නැවත නිෂ්පාදනයට, ආපදා වලට සහ වැටුප් සඳහා ය. ඉන් සමාජවාදී ජීවිතය වඩාත් යහපත් වේ.

## ඉතිරි කිරීම්

මින් අදහස් වන්නේ බැංකු තුළ කරනු ලබන ඉතිරි කිරීම් ය. සමාජවාදී රාජ්‍යලය බැංකු පවරා ගනු ලබයි. ඒ මහා පරිමාණ ධනපති ධනය සමාජ සන්තක කිරීම සඳහා ය. තවද බැංකු හරහා සිදු වන මූල්‍යය මෙහෙයුම් සමාජවාදී ආර්ථික යන්ත්‍රමයට අනුගත කරනු සඳහා ය. සාමාන්‍යර ජනතාව තැන්පත් කර ඇති මුදල් එසේම පවතිනු ඇත. නමුත් සමාජවාදය තුළ බැංකු ගනුදෙනු විවෘත භාවයෙන් යුතු වනු ඇත. එනිසා සමාජවාදය තුළ සමාජවාදී බැංකු පවතිනු ඇත.

## මුදල්

එය තවදුරටත් ශ්‍රමය සූරාකෑමේ මාධ්‍යයක් නොවේ. ශ්‍රම ශක්තියට මිල නියම කරන්නක් නොවේ. සමස්ත ශ්‍රමයේ වටිනාකම මූල්‍යමය වශයෙන් ප්‍රකාශ කරන්නකි. මුදල් යනු සමාජවාදී ගනුදෙනු වල පහසුව සලසන හුවමාරු මාධ්‍යයකි. එය කිසි විටෙක අතිරික්ත වටිනාකම් ධනපතියන් අතර බෙදා ගන්නා මාධ්‍යයක් නොවේ.

## වෙළඳපොළ

සමාජවාදී වෙළඳපොළ යනු ජනතාවගේ පරිභෝජන අවශ්‍යතා ප්‍රකාශ කරනු ලබන තොරතුරු මධ්‍යස්ථානයකි. එම අවශ්‍යතා සපුරා ගනු ලබන මධ්‍යස්ථානයකි. ලාභය වෙනුවට අවශ්‍යතාව ප්‍රමුඛ වූ ස්ථානයකි. එය තරගයට, අහඹු වලට සහ අරාජිකත්වයට දොර විවර කරනවා වෙනුවට සැලසුම් කරන ලද සහ මධ්‍යගත මෙහෙයුමට යටත් එකකි.

## තුලනය තුළින් සාධාරණත්වය

සමාජවාදය පංති ආරක්ෂා කරන්නේ නැත. පංති අහෝසි කිරීමෙහි යෙදෙයි. එනිසා සියලූ ම සමාජ විෂමතා ක්‍රමයෙන් අහෝසි කරන හා යළි විෂමතාව ඇතිවීම වැළැක්වෙන ක්‍රියාමාර්ග හරහා ආර්ථිකය තුලනාත්මක ව පවත්වා ගනු ලබයි. එහි දී ආර්ථිකයේ වැඩි අවදානම ඇත්තේ කොතැන ද, වැඩි අවධානය යොමු කළ යුත්තේ කොතැනට ද, වැඩි මෙහෙයුම යෙදවිය යුත්තේ කොතැනට යන්න සලකා බැලෙයි. මෙහි දි ආර්ථික කලනය යන සංකල්පයක් භාවිතාවේ. සමාජවාදයේ ආර්ථික කලනය යනු සැලසුම් සහගත ආර්ථිකයේ ඉලක්ක සපුරා ගැනීමේ දී අදාළ විය වසායේ ද්‍රව්‍යමය සම්පත්, මූල්‍ය සම්පත් හා ශ්‍රම සම්පත් වඩාත් බුද්ධිමත් ව යොදාගැනීමත්, පලදායි ලෙස පවත්වා ගැනීම සඳහා වන සමාජවාදී කළමනාකරණයයි. විවිධ සමාජවාදී රටවල ආර්ථික කලනයේ ප්‍රතිපත්ති වෙනස් විය හැකිය. එහෙත් ඒවායේ පහත සඳහන් සමාන කම් දැකිය හැකිය.

■ එම නිශ්චිත ව්‍යවසාය ආර්ථිකය තුළ තම ස්වාධීනත්වය රැක ගැනීම.
■ එම ව්‍යවසාය පිරිවැය ආදිය සලකමින් ලාභ සහිත එකක් බවට පත් කිරීම.
■ සෑම ශ්‍රම සමූහයකට හා වැඩ කරන පුද්ගලයන්ට කරනු ලබන ද්‍රව්‍යමය දිරිගැන්වීම්.
■ ශ්‍රම සමූහය හෝ තනි ශ්‍රමිකයාගේ වගකීම.

මේ ප්‍රතිපත්ති සපුරා ගැනීම උදෙසා අරමුදල් තුනක් භාවිතාවේ.

1. නිෂ්පාදන සංවර්ධන අරමුදල
2. ද්‍රව්‍යමය දිරිගැන්වීම් අරමුදල
3. සමාජ සංස්කෘතික අරමුදල

අවසාන වශයෙන් මෙම සැලසුම් සහගත හා තුලනාත්මක ආර්ථිකයේ දී එම ව්‍යවසායන් තම වියදම් දරා ගනිමින් ශ්‍රම සමූහය ම වෙනුවෙන් නිශ්චිත සමාජවාදී සමුච්චයක් සඳහා අතිරික්තයක් නිපදවිය යුතු ය. එසේම සමස්ත සමාජවාදී අතිරික්තය ආර්ථික හා සමාජ කටයුතු සඳහා මනා සමාලෝචනයකින් භාවිතා විය යුතු ය.

සමාජවාදී ආර්ථික දේහය නිරෝගීමත් ව පවත්වා ගනු ලබන්නේ සහ ජවයෙන් වර්ධනය කරනුයේ මෙම සැලසුම් සහගත හා තුලනාත්මක ආර්ථිකයයි. එම ආර්ථිකයේ වර්ධනයේ දිශාව හා පැතිරිය යුතු ප්‍රදේශ තීරණය වන්නේ ද ඒ අනුව ය. ඉන් සමාජවාදී ආර්ථිකයේ දී ධනවාදී පෞද්ගලික තරගය ඉවත් කරයි. සාමූහික තරග ආදේශ කරයි. අරාජිකත්වය මුළුමනින් ම තුරන් කරයි.

උපුටා ගැනීම - වමේ පුස්තකාලය වෙබ් අඩවිය.

**ජනතා විමුක්ති පෙරමුණ**
ඕස්ට්‍රේලියා කමිටුව